# දැය පුබුදු කළ බුද්ධ පුත්‍රයාණෝ



මෙල්බර්න්හි බෙරික් ශාක්‍යමුනි
සම්බුද්ධ විහාරවාසී
පූජ්‍ය පණ්ඩිත
**දිද්දෙනිපොත ධම්මානන්ද හිමි**

මහරගම සිරි වජිරඤාණ ධර්මායතනාධිපති හා කොළඹ බම්බලපිටියේ වජිරාරාමධිපති අමරපුර නිකායේ උත්තරීතර මහානායක අග්ගමහා පණ්ඩිත අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ සහ අතිපූජ්‍ය අම්පිටියේ ශ්‍රී රාහුල ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ශිෂ්‍යයකු ලෙස ගංගොඩවිල සෝම ස්වාමීන් වහන්සේ 1974.09.24 වැනි දින මහරගම සිරි වජිරඤාණ ධර්මායතනයේ දී පැවිදි බිමට පත්වූහ.

1948.04.24 වැනි දින උපත ලැබූ උන්වහන්සේගේ ගිහි නම වූයේ වීරතුංග ආරච්චිලාගේ දොන් සෝමරත්න යන්නයි. නිසි වයස් සපුරා, ධර්ම - විනය මැනවින් ප්‍රගුණව සිටි සෝම ස්වාමීන් වහන්සේ 1976.05.26 වැනි දින සුපරිශුද්ධ උපසම්පදාව ලැබූහ.

උන්වහන්සේ පැවිදි වූ දින පටන් මහණකමට ආදරය කළ, මහණකමේ අගය අන්‍යයන්ටත් කියා දුන් ශ්‍රද්ධාසම්පන්න චරිතයක් විය. තෙවරක් ම අට්ඨකථාව ද සමඟ ත්‍රිපිටකය මුළුමනින් ම කියවා ඇති උන්වහන්සේ අල්පේච්ඡ බව, යථාලාභ සන්තෝෂය, ඍජු බව, පරිත්‍යාගශීලී බව, අධිෂ්ඨානශීලී බව, ආදර්ශසම්පන්න බව ආදී බොහෝ ගුණයන්ගෙන් හෙබි ප්‍රියශීලී භික්ෂුවක වූහ.

ධර්ම සන්නිවේදන කාර්යයේ දී විශේෂ හැකියාවක් දැක්වූ සෝම ස්වාමීන් වහන්සේගේ ධර්ම දේශනා තුළින් ලොව පුරා ධර්මයට උනන්දුවක් දැක්වූ ජනතාව තුළ බොදු හැදියාවක් විචාරශීලී චින්තනයත් වැඩිදියුණු කරන්නට ප්‍රබල ශක්තියක් ලැබුණි. දහම් රසය බෙදා දීමේ හා ජාතිය සුවපත් කිරීමේ අභිප්‍රාය ඇතිව ගංගොඩවිල සෝම ස්වාමීන් වහන්සේ විසින් ලියන ලද ගද්‍ය පද්‍ය කෘති රාශියකි. තම ගුරුදෙව් මහ නා හිමිපාණන් වහන්සේගේ මග යමින් තම ආගමික හා ජාතික සේවාව පුළුල්ව ඉටු කිරීමේ අභිප්‍රාය ඇතිව "ජනවිජය" පදනම පිහිටුවා ඒ තුළින් ජාතියේ සදාචාරය හා සෞභාග්‍යය උදා කිරීමට අගනා සේවාවක් ඉටු කළහ.

සෝම ස්වාමීන් වහන්සේගෙන් ජාත්‍යන්තර වශයෙන් සිදුවූ ආගමික මෙහෙවර ප්‍රශස්තය. උන්වහන්සේ ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් නුවරට වැඩම කොට බොහෝ දුෂ්කරතා ජය ගනිමින් ආරම්භ කළ බෙරික් ශාක්‍යමුනි සම්බුද්ධ විහාරය අද ඕස්ට්‍රේලියාවේ වෙසෙන බොදුනුවන්ට හා ඔවුන්ගේ දරු-දැරියන්ට ඉටු කරන ශාසනික මෙහෙවර අගය කළ යුතුය. දැනට එහි විහාරධිපතීන් වහන්සේ වන්නේ ඕස්ට්‍රේලියාවේ ප්‍රධාන සංඝනායක ශාස්ත්‍රපති පණ්ඩිත ගරු දිගාමඩුල්ලේ විමලානන්ද ස්වාමීන් වහන්සේ ය. තව ද ඕස්ට්‍රේලියාව තුළ ආරම්භ කොට පවත්වා ගෙන යනු ලබන විහාරස්ථාන රාශියකම විහාරධිපතීන් වහන්සේලා ගරු සෝම ස්වාමීන් වහන්සේ විසින් ඕස්ට්‍රේලියාවට වඩමවනු ලැබ ඒ මග පෙන්වීම අනුව ශාසනික මෙහෙවරෙහි යෙදුණෝ වෙති.

විදේශ ධර්ම ප්‍රචාරයට වඩා පසු කාලීනව සෝම ස්වාමීන් වහන්සේ උනන්දු වූයේ ශ්‍රී ලාංකික බොදුනු ජනතාව තුළ ආගමික හැදියාවත් සමස්ත ශ්‍රී ලාංකිකයන් තුළ ජාතික හැඟීමක් තීව්‍ර කර ඒ තුළින් රටත් ජාතියත් සම්බුද්ධ ශාසනයත් ආරක්ෂා කිරීමට තම කාලය, ශ්‍රමය හා බුද්ධිය කැපකිරීමටය. බොහෝ අවස්ථාවල ජාතියට එවැනි සේවාවක් ඉටු කිරීමට ඉදිරිපත් වන අයට අත්වන ඉරණමට ගොදුරු වෙමින් ගරු සෝම ස්වාමීන් වහන්සේ රුසියාවේ ශාන්ත පීටර්බර්ග්හි දී 2003.12.12 වැනි දින කිසිවෙකුත් බලාපොරොත්තු නොවූ අයුරින් අපවත් වී වදාළහ. මෑත ඉතිහාසයේ වැඩිම ජන සහභාගිත්වයකින් සිදු වූ ආදාහන පූජෝත්සවය ලෙස සැලකෙන ගරු සෝම ස්වාමීන් වහන්සේගේ ආදාහනය ලක්ෂ සංඛ්‍යාත ජනතාවගේ සෝ සුසුම් මැද කොළඹ නිදහස් චතුරශ්‍රයේ දී 2003.12.24 දින සිදු කරන ලදී.

ගරු ගංගොඩවිල සෝම ස්වාමීන් වහන්සේගේ අපවත් වීමෙන් 2013.12.12 වැනිදට වසර 10ක් සපිරේ. උන්වහන්සේට පුණ්‍යානුමෝදනා කිරීම් වස් ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් නුවර බෙරික් ශාක්‍යමුනි සම්බුද්ධ විහාරයේ දී 2013.12.07 දින "සදහම් වැස්ස" විශේෂ සීල-භාවනා වැඩ සටහන හා දෙසැම්බර් 08 දින දහවල් සංඝගත දක්ෂිණාවක් පිරිනැමීම සිදු කෙරේ.

FERGUSON HIGH SCHOOL
O.G.A. Australia Reunion




Tickets $40.00 per person
Further Information Contact:
Nadee 0400205155
Nilu 0404852405
Vishaka 0401525835

Music and entertainment by
DJ NAZ
Dinner bought to you by
SWAN catering
B.Y.O

7:00pm to Midnight
1st Febuary 2014
Oakleigh Hall
142-144 Drummond St
Oakleigh, VIC 3166